# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2019 ඔක්තෝබර් මස 04 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2019.10.09 දින නිකුත් කරන ලදී)**


# ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය

**ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 28.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය

එල්. ඩී.—ඕ. 33/2019

**ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 2019 අංක     දරන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

### I වන කොටස

### ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පිහිටුවීම.

2. (1) (මෙහි මින්මතු "නියෝජ්‍යායතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය යනුවෙන් හඳුන්වන නියෝජ්‍යායතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) නියෝජ්‍යායතනය, (1) වන උපවගන්තිය මගින් එයට පවරන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, එකී සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

නියෝජ්‍යායතනයේ අරමුණු.

3. නියෝජ්‍යායතනයේ අරමුණු -

(අ) සමාජයීය නවෝත්පාදන, විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදන, ආරක්ෂක නවෝත්පාදන, පාරිසරික නවෝත්පාදන සහ සේවා නවෝත්පාදන සම්බන්ධයෙන් සහ ආර්ථිකය කෙරෙහි ඒවායේ ඇති බලපෑම පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඇති කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ආ) නවෝත්පාදනයට අදාළව ජාතික ප්‍රතිපත්ති සකස්කිරීම සඳහා රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) ජාතික පර්යේෂණය, ආර්ථිකය සහ ජාතික ආර්ථික අභිමතාර්ථ සමඟ සමගාමී වන බව සහ ඊට දායක වන බව සහතික කරගැනීම;

(ඇ) ප්‍රතිඵල වැඩි දියුණු කිරීම සඳහා නවෝත්පාදකයන් සහ මූලාරම්භකයන් සම්බන්ධීකරණය කිරීම;

(ඉ) නවෝත්පාදනයට බාධා වන්නා වූ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ යම් බාධක හඳුනාගැනීම;

(ඊ) විචිත්‍රවත් ජාතික නවෝත්පාදන පරිසර පද්ධතියක් පිහිටුවීම සඳහා පෞද්ගලික අංශයේ නවෝත්පාදන සඳහා සහාය ලබා දීම සහ පහසුකම් සැලැස්වීම,

විය යුතු ය.

නියෝජ්‍යායතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය.

4. නියෝජ්‍යායතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය වනුයේ-

(අ) නියෝජ්‍යායතනයේ අරමුණුවල වැදගත් කාරණාවලට අදාළ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධීකරණය;

(ආ) උත්පාදක ආර්ථිකයකට සහාය ලබාදීම සඳහා ජාතික නවෝත්පාදන වැඩසටහන් ආරම්භ කිරීම සහ ඊට අරමුදල් සැපයීම සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි වූ ශ්‍රී ලංකා නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව උපායමාර්ගය සමඟ අනුකූලව ජාතික නවෝත්පාදන පරිසර පද්ධතියක් වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම;

(ඇ) පර්යේෂණ හා තාක්ෂණ හුවමාරුව මගින් බිහිවන උසස් තාක්ෂණික ව්‍යවසායයන් සඳහා පහසුකම් සැලැස්වීම තුළින් ජාතික නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව උපායමාර්ග අරමුණුවලට සහාය ලබාදීම;

(ඉ) නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය සම්බන්ධ ආයෝජන ප්‍රතිපත්ති සහ උපායමාර්ගවල ඵලදායිතාවය නියාමනය කිරීම සහ ඇගයීම;

(ඊ) නවෝත්පාදන කටයුතුවල නිමැවුම් වාණිජ්‍යකරණය දිරිමත් කිරීම සඳහා නවෝත්පාදනයේ ජාත්‍යන්තර කටයුතු, අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ශ්‍රී ලංකාවේ වෙනත් නවෝත්පාදන ආයතන සමග සහ ජාත්‍යන්තර ආයතන සමග සම්බන්ධීකරණය කිරීම සහ සුසංයෝග කිරීම;

(උ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි වූ ශ්‍රී ලංකා නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව උපායමාර්ගයට යටත්ව, ප්‍රත්‍යස්ථිත ආර්ථික තත්ත්වයක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රගතිය ගෝලීය නවෝත්පාදන දර්ශක ශ්‍රේණිගත කිරීම ඔස්සේ ඉහළට ගෙන යාම;

(ඌ) ජාත්‍යන්තර සම්බන්ධතාවය සහ අභිමුඛභාවය සැලකිල්ලට ගෙන පරිසර පද්ධතිය ආවරණය කරමින් ශ්‍රී ලංකා වාර්ෂික නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව වාර්තා ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම, ඇගයීම සහ පළකිරීම;

(එ) නියෝජ්‍යායතනයේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේ ආකල්පයක් ඇතිව යෝග්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි නියෝජ්‍යායතනය සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළ මිල දී ගැනීම, නියෝජ්‍යායතනය සතු යම් චංචල හෝ නිශ්චල දේපළ දැරීම, බද්දට හෝ කුලියට ලබා ගැනීම හෝ ලබා දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඒ) අදාළ වන්නා වූ යම් ලිඛිත නීතියකට යටත්ව, යම් රාජ්‍ය බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ වෙනත් තැන්පතු ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යාම සහ එම ගිණුම් වසා දැමීම;

(ඔ) අදාළ වන්නා වූ යම් ලිඛිත නීතියකට යටත්ව, නියෝජ්‍යායතනයේ භාවිතය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත මූලාශ්‍රවලින් ලැබෙන නිශ්චල සහ චංචල ත්‍යාග, ප්‍රදාන, ණය, පරිත්‍යාග සහ රික්තාවරණ භාරගැනීම සහ ලබා ගැනීම:

එසේ වුව ද, නියෝජ්‍යායතනය වෙත ලැබෙන සියලුම විදේශ ප්‍රදාන, පරිත්‍යාග හෝ රික්තාවරණ වෙනුවෙන් නියෝජ්‍යායතනය විසින් මුදල් අමාත්‍යාංශයේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඕ) නියෝජ්‍යායතනයේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන්නා වූ නියෝජ්‍යායතනයේ අරමුදල්, නියෝජ්‍යායතනයේ යම් බැංකු ගිණුමක හෝ ගිණුම්වල තැන්පත් කිරීම;

(ක) නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම;

(ග) අදාළ මුල්‍ය රෙගුලාසිවලට අනුකූලව කරනු ලබන යෝග්‍ය ගෙවීම් සඳහා නියෝජ්‍යායතනයේ කාර්යය සහ කර්තව්‍යය සුමට ලෙස සහ කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පර්යේෂණ, දත්ත එක්රැස් කිරීම හෝ වෙනත් යම් කටයුතු, බැහැරින් ලබා ගැනීම, මේ පනතේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් සිදුකරන සියලු පර්යේෂණ, එකතු කරන ලද යම් ද්‍රව්‍ය හෝ දත්තවල හිමිකාරිත්වය නියෝජ්‍යායතනය සතු විය යුතු අතර, එම පර්යේෂණ, ද්‍රව්‍ය හෝ දත්ත ආරක්ෂා කිරීම සඳහා වගකිව යුතු ය;

(ච) අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, නියෝජ්‍යායතනයේ අරමුණු සම්බන්ධයෙන් යම් දේශීය හෝ විදේශීය තැනැත්තන් හෝ ආයතන සමඟ ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ජ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, නියෝජ්‍යායතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පෞද්ගලික අංශය සමඟ බද්ධ ව්‍යාපාර සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම;සහ

(ට) සාමාන්‍යයෙන්, නියෝජ්‍යායතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් ක්‍රියා සහ දේ කිරීම.

## II වන කොටස

## නියෝජ්‍යායතනයේ පරිපාලනය සහ කළමනාකරණය

**5.** (1) නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලන සභාවකට පැවරිය යුතු ය. නියෝජ්‍යායතනයේ පරිපාලනය.

(2) සභාව විසින්, සභාවේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්ය සඳහා, මේ පනත මගින් නියෝජ්‍යායතනය වෙත ලබා දී ඇති, පවරා දී ඇති හෝ නියම කර ඇති බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම කළ යුතු ය.

**6.** (1) සභාව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:- සභාවේ සංයුතිය.

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත් වන සාමාජිකයන්ගෙන්, එනම්—

(i) සභාවේ සභාපතිවරයා විය යුතු ජනාධිපති ලේකම්වරයා;

(ii) සංවර්ධන උපායමාර්ග විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුට නොඅඩු නිලයක් දරන එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු;

(iii) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුට නොඅඩු නිලයක් දරන එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු;

(iv) ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ හෝ අධ්‍යක්ෂවරයකුට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු;

(v) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(vi) විද්‍යාව විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුට නොඅඩු නිලයක් දරන එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු;

(vii) තාක්ෂණය සහ පර්යේෂණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුට නොඅඩු නිලයක් දරන එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු;

(viii) ජාත්‍යන්තර වෙළෙඳාම විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුට නොඅඩු නිලයක් දරන එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු;

(ix) ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ආ) (i) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන, නවෝත්පාදනය, සමාජයීය නවෝත්පාදනය, ව්‍යවසායකත්වය, ව්‍යාපාර, වානිජමය සමපේක්ෂණ ප්‍රාග්ධනය, අධ්‍යාපනය හෝ මූල්‍ය සම්බන්ධයෙන් විශිෂ්ටත්වය ළඟා කරගෙන ඇති එක් තැනැත්තකුගෙන්; සහ

(ii) රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකෙන්ම, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන නවෝත්පාදනය, ව්‍යවසායකත්වය, සමාජයීය නවෝත්පාදනය, ව්‍යාපාර, වානිජමය සමපේක්ෂණ ප්‍රාග්ධනය, නීතිය, අධ්‍යාපනය හෝ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් විශිෂ්ටත්වය ළඟා කරගෙන ඇති තැනැත්තන් හයදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකගෙන්.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති විෂයයන් අමාත්‍යාංශ එකකට හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවකට අයත් වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන අතිරේක ලේකම්වරයකුගේ

නිලයට නොඅඩු නිලයක් දරනු ලබන එකී එක් එක් අමාත්‍යාංශයේ යම් නිලධරයකු සභාවේ සාමාජිකයකු විය යුතු ය.

සභාවේ සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකම්.

7. යම් තැනැත්තකු -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම නතර වේ නම්;

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ඇ) සභාවේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කර්තව්‍ය ඉටුකරනු ලැබීමේ දී බලපෑමක් ඇති විය හැකි මූල්‍යමය හෝ වෙනත් යම් සබඳතාවක් ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම්;

(ඉ) නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තකු වේ නම්; හෝ

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්,

එම තැනැත්තා සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය.

8. සභාවේ සෑම පත් කළ සාමාජිකයකු ම මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස් කරනු ලැබුවහොත් මිස, වසර තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස අනුගාමී හෝ අනුගාමී නොවන තවත් එක් කාලසීමාවකට නොවැඩි කාලසීමාවක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතු ය.

**9.** (1) සභාවේ පත් කළ යම් සාමාජිකයකු තත්කාර්ය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ජනාධිපතිවරයා විසින් ලිඛිතව එම ඉල්ලා අස්වීම පිළිගනු ලබන දින සිට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

පත් කළ සාමාජිකයන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය.

(2) ජනාධිපතිවරයා විසින් ඒ සඳහා හේතු දක්වා යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇති යම් පත් කළ සාමාජිකයකු සභාවේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කිරීමට හෝ වෙනත් යම් තත්ත්වයකින් සභාවේ සේවය කිරීමට සුදුසුකම් නොලැබිය යුතු ය.

(3) යම් පත්කළ සාමාජිකයකුගේ මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් ධුරය හිස් වන අවස්ථාවක, 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට යටත්ව, ජනාධිපතිවරයා විසින්, එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එම තැනැත්තා, තමා අනුප්‍රාප්ත වනුයේ යම් සාමාජිකයකුගේ ධුරයක් සඳහා ද, එම සාමාජිකයාගේ ඉකුත් නොවී ඉතිරිව ඇති ධුර කාලය සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(4) අසනීපවීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මාස තුනකට නොඅඩු කාලසීමාවක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට සභාවේ යම් පත් කළ සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, ජනාධිපතිවරයා විසින්, 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් එම සාමාජිකයා නොමැති කාලය තුළ දී ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) සභාවේ යම් පත් කළ සාමාජිකයකු විසින්, නොපැමිණීම සඳහා සභාපතිවරයාගේ පූර්ව අවසරය ලබා නොගෙන සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීමට අපොහොසත් වන අවස්ථාවක, තුන්වන රැස්වීම අවසානයේ දී එම සාමාජිකයා ස්වකීය ධුරය හිස් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ජනාධිපතිවරයා විසින්, (3) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයෙන්, එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

**සභාවේ රැස්වීම්.**

**10.** (1) 14 වන වගන්තිය යටතේ පත් කරනු ලබන නියෝජ්‍යායතනයේ ප්‍රදාන නවෝත්පාදන නිලධරයා විසින් සභාවේ සියලු රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(2) සභාවේ සාමාජිකයන් පෞද්ගලිකව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය මගින් හෝ සභාවේ රැස්වීම්වලට සහභාගී විය හැකි ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා "ඉලෙක්ට්‍රොනික මාධ්‍ය" යන්නෙන්, විඩීයෝ සම්මන්ත්‍රණ හෝ වෙබ් සම්මන්ත්‍රණ අදහස් වේ.

(3) සභාවේ පුරප්පාඩුවක් පැවතීමේ හෝ සභාවේ සාමාජිකයකු පත්කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුවෙන් ම පමණක් සභාවේ කිසිදු ක්‍රියාවක් හෝ ක්‍රියාපටිපාටියක් අවලංගු නොවිය යුතු ය.

(4) සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා නොපැමිණි අවස්ථාවල දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු සභාවේ රැස්වීමක මුලසුන දරනු ලැබිය යුතු ය.

(5) සභාවේ යම් රැස්වීමක ගණපූරණය, සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය. ඡන්දය සමාන වන අවස්ථාවක දී, සභාවේ සභාපතිවරයාට සිය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

**සභාව විසින් රැස්වීම් සඳහා ප්‍රවීනයන්ට ආරාධනා කළ හැකි බව.**

**11.** (1) සභාවේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා, සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි ඕනෑම අවස්ථාවක, සභාවේ යම් රැස්වීමක දී කටයුතු කරනු ලබන යම් විෂයයක් සම්බන්ධයෙන් විශිෂ්ටත්වයක් ඇති ප්‍රවීණයන්ගේ අදහස් එම විෂයය කාරණය සම්බන්ධයෙන් ලබා ගැනීම සඳහා ඔවුන්ට එම රැස්වීමට ආරාධනා කළ හැකි ය. එසේ වුව ද, එම අදහස් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පරම අභිමතය සභාව සතු වන්නේ ය.

(2) ප්‍රවීනයන් වෙත සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික, ගෙවනු ලැබිය යුතු අතර, ඔවුන්ට ඡන්දය දීමේ කිසිදු අයිතියක් නොතිබිය යුතු ය.

**සභාවේ රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් වූ පාරිශ්‍රමික.**

**12.** මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික, සභාවේ සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය යුතු ය.

නියෝජ්‍යායතනයේ මුද්‍රාව.

**13.** (1) නියෝජ්‍යායතනයේ මුද්‍රාව -

(අ) සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ආ) සභාව විසින්, කලින් කල, තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ යම් තැනැත්තකුගේ භාරයේ තැබිය යුතු ය; සහ

(ඇ) සභාවේ අවසරය ඇතිව මිස සහ සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී එසේ පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එම සාමාජිකයන් දෙදෙනා විසින් එකී සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තබනු ලබන අවස්ථාවක දී හැර, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නියෝජ්‍යායතනයේ මුද්‍රාව නොතැබිය යුතු ය.

(2) සභාව විසින්, නියෝජ්‍යායතනයේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳව ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

## III වන කොටස

## නියෝජ්‍යායතනයේ ප්‍රධාන නවෝත්පාදන නිලධරයා සහ කාර්ය මණ්ඩලය

නියෝජ්‍යායතනයේ ප්‍රධාන නවෝත්පාදන නිලධරයා.

**14.** (1) ජනාධිපතිවරයා විසින් සභාව විමසා, සභාව විසින් නිශ්චය කරනු ලබන යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, නියෝජ්‍යායතනයේ ප්‍රධාන නවෝත්පාදන නිලධරයා වශයෙන්, සනාථ කරන ලද කළමනාකරණ පළපුරුද්ද සමඟ පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාව හෝ තාක්ෂණය සහ නවෝත්පාදනයට අදාළ පශ්චාත් උපාධියක් හිමි තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය. සභාවේ යම් රැස්වීමකට සහභාගී වීමට ඔහුට හැකි නමුත්, එවැනි යම් රැස්වීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

(2) ප්‍රධාන නවෝත්පාදන නිලධරයා සභාවේ සාමාන්‍ය විධානයට යටත් විය යුතු අතර, නියෝජ්‍යායතනයේ පරිපාලනය සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(3) මුදල් විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයේ යම්

පාරිශ්‍රමිකයක් ප්‍රධාන නවෝත්පාදන නිලධරයා හට ගෙවනු ලැබිය යුතු ය.

(4) ජනාධිපතිවරයා විසින් සභාවේ නිර්දේශය මත සහ ඒ සඳහා හේතු දක්වා, මේ වගන්තිය යටතේ පත්කරන ලද ප්‍රධාන නවෝත්පාදන නිලධරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලය පත්කිරීම.

**15.** (1) නියෝජ්‍යායතනයේ කර්තව්‍යය කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි නියෝජ්‍යායතනය විසින් සලකනු ලබන යම් නිලධරයන් සහ සේවානියුක්තයන් සංඛ්‍යාවක් නියෝජ්‍යායතනය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) නියෝජ්‍යායතනය විසින් (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද නිලධරයන් සහ සේවානියුක්තයන් සම්බන්ධයෙන්-

(අ) එම නිලධරයන් සහ සේවානියුක්තයන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම ඉවත් කිරීම හෝ ඔවුන් ඉවත් කිරීම;

(ආ) එම නිලධරයන් සහ සේවානියුක්තයන්ගේ සේවා නියම සහ කොන්දේසි තීරණය කිරීම;

(ඇ) සභාව විසින්, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, නිලධරයන් සහ සේවානියුක්තයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකවල අනුප්‍රමාණ නිශ්චය කිරීම; සහ

(ඈ) එම නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සුභසාධන කටයුතු සඳහා සේවක සුභසාධන සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ එම යෝජනා ක්‍රමවලට දායක වීම,

නියෝජ්‍යායතනය විසින් කළ හැකි ය.

නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත්කිරීම.

**16.** (1) සභාවේ ඉල්ලීම මත, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කිරීම හෝ, එවැනිම කැමැත්ත ඇතිව එකී කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබ ඇති අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එකී නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එකී නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

*නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපන ආයතනවල නිලධරයන් පත් කිරීම.*

**17.** (1) සභාවේ ඉල්ලීම මත, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු, එම නිලධරයාගේ හෝ සේවා නියුක්තයාගේ සහ එම උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. එකී පත්කිරීම සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා විය යුතු අතර, එවැනිම කැමැත්ත ඇතිව සභාව සහ එකී ප්‍රධාන විධායක නිලධරයා විසින් එකඟ විය හැකි, විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ඇතුළු නියම හා කොන්දේසි මත ස්ථිරව පත් කිරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී, එම තැනැත්තා කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයටම යටත් විය යුතු ය.

## IV වන කොටස

## මුදල්

*නියෝජ්‍යායතනයේ අරමුදල.*

**18.** (1) නියෝජ්‍යායතනයට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) එම අරමුදලට පහත සඳහන් දෑ බැර කරනු ලැබිය යුතු යː-

(අ) නියෝජ්‍යායතනයේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින්, කලින් කල, සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) නියෝජ්‍යායතනය විසින් ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී සහ නියෝජ්‍යායතනයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා 4(ඔ) වගන්තියේ අතුරු විධානයේ විධිවිධානවලට යටත්ව ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ත්‍යාග, ප්‍රදාන, ණය, පරිත්‍යාග සහ රික්ථවරණ වශයෙන් නියෝජ්‍යායතනයට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ඇ) මේ පනත යටතේ ගාස්තු, රාජ්‍ය භාග හෝ අයකිරීම් වශයෙන් නියෝජ්‍යායතනයට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්.

(3) මේ පනත යටතේ නියෝජ්‍යායතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී නියෝජ්‍යායතනය දරන ලද සියලු වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන් නියෝජ්‍යායතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

නියෝජ්‍යායතනයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**19.** (1) නියෝජ්‍යායතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) නියෝජ්‍යායතනය විසින් නියෝජ්‍යායතනයේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් හා අනෙකුත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන නියෝජ්‍යායතනයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ද අදාළ කරගනු ලැබිය යුතු ය.

## V වන කොටස

### සාමාන්‍ය

වාර්ෂික වාර්තා.

**20.** (1) නියෝජ්‍යායතනය විසින්, එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස හයක කාලයක් ඇතුළත නියෝජ්‍යායතනය විසින් කරගෙන යන ලද ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

එම වාර්තාවට පහත දැක්වෙන ලේඛන අමුණා තිබිය යුතු යː-

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව සහිතව වර්ෂය සඳහා නියෝජ්‍යායතනයේ විගණනය කරන ලද ගිණුම්;

(ආ) එකී වාර්තාව සහ ගිණුම්වලට අදාළ වර්ෂයෙන් ඉක්බිතිව ම එළඹෙන වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම් සම්බන්ධ වාර්තාවක්; සහ

(ඇ) නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය සම්බන්ධ ආයෝජන, ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන්ගේ ඵලදායිතාවය පිළිබඳ වාර්තාවක්.

(2) ජනාධිපතිවරයා විසින්, වාර්ෂික වාර්තාව ලද දින සිට මාස තුනක කාලයක් තුළ දී, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන ද සමඟ එකී වාර්තාව පාර්ලිමේන්තුවේ සලකා බැලීම සඳහා සභාගත කළ යුතු ය.

රහස්‍යතාවය පිළිබඳ ප්‍රකාශය.

**21.** සභාවේ සාමාජිකයන් සහ නියෝජ්‍යායතනයේ නිලධරයන් හා සේවානියුක්තයන් විසින් ස්වකීය කාර්යයන්ට ප්‍රවිශ්ට වීමට පෙර නියෝජ්‍යායතනයේ කාර්ය හා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් තමා දැඩි රහස්‍යතාවක් පිළිපදින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර, ඔහු විසින් සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී තමාගේ දැනුමට යටත් විය හැකි යම් කාරණයක්-

(අ) අධිකරණයක් විසින් හෙළිදරව් කරන ලෙස නියම කරනු ලැබූ විට; හෝ

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් සමඟ අනුකූල වීම සඳහා,

හැර, හෙළිදරව් නොකරන බවට ඒ ප්‍රකාශය මගින් පොරොන්දු විය යුතු ය.

*ජනාධිපතිවරයා විසින් කරනු ලබන විධාන.*

**22.** ජනාධිපතිවරයා විසින්, මේ පනත යටතේ වන බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම සම්බන්ධ යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන, කලින් කල, සභාව වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, එම විධානවලට අනුකූලව කටයුතු කිරීම සභාවේ කාර්යය විය යුතු ය.

*නියෝජ්‍යායතනයේ නිලධරයන් සහ සේවානියුක්තයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.*

**23.** නියෝජ්‍යායතනයේ සියලු නිලධරයන් හා සේවානියුක්තයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

*නියෝජ්‍යායතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.*

**24.** නියෝජ්‍යායතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

*රීති.*

**25.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සභාව විසින්, 15 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

*නියෝග.*

**26.** (1) ජනාධිපතිවරයා විසින්, මෙම පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ නියෝග සාදනු ලැබිය යුතු බවට මේ පනත මගින් බලය දී ඇති හෝ නියම කරනු ලැබ ඇති සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින් මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, ඒ සෑම නියෝගයක් ම එසේ පළකරන ලබන දිනයේ හෝ ඒ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, එය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් තෙමසක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්

කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එම අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**27.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"නවෝත්පාදනය" යන්නට, සමාජ නවෝත්පාදන, විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදන, ආරක්ෂණ නවෝත්පාදන, පරිසර නවෝත්පාදන සහ සේවා නවෝත්පාදන යන ක්ෂේත්‍රයන්හි -

(අ) නව තාක්ෂණික ආකෘතියක්, උපයෝගීතා ආකෘතියක් හෝ කාර්මික සැකසුමක්;

(ආ) නව නිෂ්පාදනයක්, නව ක්‍රියාවලියක්, නව සේවයක් හෝ නව අදහසක්;

(ඇ) නව නිෂ්පාදනයක, සේවයක හෝ කාර්මික ක්‍රමයක, ව්‍යාපාරයක හෝ සමාජයක වැඩිදියුණු කළ භාවිතයක්;

(ඈ) පැළෑටි, සත්ත්වයන් සහ පරිසරය ඇතුළු ස්වාභාවික සම්පත් භාවිතය තුළින් මිනිසුන් විසින් ලබාගත් දේශීය හෝ පාරම්පරික දැනුම; සහ

(ඉ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ විධිවිධානවලට යටත්ව ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම හෝ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සඳහා සුදුසු බවට සලකනු ලැබිය හැකි පේටන්ට් ලබාගත නොහැකි වෙනත් නිර්මාණ හෝ වැඩිදියුණු කිරීම්,

ඇතුළත් වන අතර "නවෝත්පාදකයා" යන්න ඒ අනුව තේරුම් ගත යුතු ය.

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පවරනු ලැබූ අමාත්‍යවරයා අදහස් වේ;

"ජාතික නවෝත්පාදන පරිසර පද්ධතිය" යන්නෙන්, නවෝත්පාදනය සඳහා අවශ්‍ය වන එක්ව පවතින සහ ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක වන රටේ පවතින සංවිධාන, ආයතන සහ මිනිසුන් ඇතුළු සහභාගීවන්නන්ගේ බහුවිධ ස්වභාවය සහ සම්පත් අදහස් වේ;

"සමාජයීය නවෝත්පාදන පර්යේෂණාගාරය" යන්නෙන්, පුරවැසි කේන්ද්‍රීය නියැලුම් රට පුරා ක්‍රියාත්මක කිරීමට පෙර ඒවා කඩිනම් වන බව සහ සාකල්‍ය වන බව සහතික කර ගැනීමට පුරවැසි කේන්ද්‍රීය නියැලුම් හරහා සමාජ ප්‍රශ්නවලට සංවර්ධන විසඳුම් මූලරූපී කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා ඉදිරි දැක්මක් සහ නවෝත්පාදන මෙවලම් භාවිත කරන ස්ථානයක් අදහස් වේ;

"තාක්ෂණය" යන්නෙන්, තිරසර සංවර්ධනය සඳහා වන අභිමතාර්ථ, භාණ්ඩ සහ සේවා සපුරාලීම සඳහා දැනුම යොදා ගැනීම අදහස් වේ;

"සාම්ප්‍රදායික දැනුම" යන්නෙන්, ඉඩම්, ස්වභාවික සම්පත් සහ පරිසරයේ සාකල්‍යවාදී සාම්ප්‍රදායික විද්‍යාත්මක භාවිතය සම්බන්ධයෙන් පරපුරෙන් පරපුරට වැඩිදියුණු කළ ඥානය අදහස් වේ;

"පිළිගත් විශ්වවිද්‍යාලය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලබන විශ්වවිද්‍යාලයක් අදහස් වේ.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.